නිපුණතාවය - ශාක පෝෂණය

1) ශාක වලට *N* (නයිට්‍රජන) ලබා දීමට යෙදිය හැකි රසායනික පොහොර වර්ග 2ක් නම් කර එම පොහොර වර්ග 2 හඳුනා ගත හැකි ලක්ෂණ හා අඩංගු *N* ප්‍රතිශතය වෙන වෙනම ලියන්න.

2) එප්පාවල ඇපටයිට් නිධියෙන් ලබා ගන්නා පොහොර වර්ගය කුමක්ද ? එම පොහොර මගින් ශාකවලට ලබා දිය හැකි මූලද්‍රව්‍ය කුමක්ද ?
ඉහත සඳහන් කළ මූලද්‍රව්‍ය ලබා දීමට යෙදිය හැකි වෙනත් රසායනික පොහොර වර්ගයක් ලියන්න.

3) ශාකයක මල් පිපෙන ඵල දරණ අවස්ථාවේ වැඩිපුර අවශ්‍ය වන මූලද්‍රව්‍ය කුමක් ද ? එය ලබා දීමට යෙදිය හැකි රසායනික පොහොර වර්ග 2ක් නම් කර ඒවා හඳුනාගත හැකි ලක්ෂණ ලියන්න.

4) මිශ්‍ර පොහොර යනු මොනවාද ?

5) පූර්ණ පොහොර මිශ්‍රණයක අඩංගු පෝෂක මොනවාද ?

6) පූර්ණ පොහොර මිශ්‍රණයක් පසට යෙදීමෙන් ලැබෙන වාසි අවාසි සංසන්දනය කරන්න.

7) බණ්ඩි පොහොර (T.D.M.) මිශ්‍රණය අර්ධ පොහොර මිශ්‍රණයක් ලෙස හඳුන්වන්නේ ඇයි ?

8) අර්ධ පොහොර මිශ්‍රණයක් පසට යෙදීමේ වාසි මොනවාද ?

9) බෝග වලට පොහොර යෙදීමේ විවිධ ක්‍රම උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

10) මූලික පොහොර යෙදීම හා මතුපිට පොහොර යෙදීම අතර වෙනස කුමක්ද ?